සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සතිය - 1

විෂය - බුද්ධ ධර්මය | ශ්‍රේණිය - 3 | 2021 ඔක්තෝබර් මාසය

සැකසුම : රේණුකා කුමාරි මිය - බලන්ගොඩ අධ්‍යාපන කලාපය

## 22.පාඩම - මල් දන්සල

**පුතාලට මතකද අපි ,වෙසක්,ඇසළ වගෙ ප්‍රධාන පෝයවල් වලට පන්සල් යන්න පිටත් වුණාම අපිට පාරෙ යන්න අමාරුයි.දන්සල් දෙනවා.අපිත් හරි සතුටින් දන්සල් වලින් කනවා.**

- මට කියන්න බලන්න එහෙමනම් ඒ දන්සල් වලින් මොනවාද දුන්නේ කියලා.
- ඉතින් දුවේ පුතේ ඔයාල දන්නවනම් කියන්න මල් දන්සලක් දෙනවනම් අපට මොනවගෙ දේවල් උවමනායි කියලා.
- දන්සල් වැඩියෙන් දෙන්නෙ මොන පෝයවල් වලටද ?
- එහෙමනම් දුවේ පුතේ මල් දන්සලක් දෙන ආකාරය පිළිවෙලට ලියන්න පුළුවන් නේද?

  ඔන්න ඊව ඒ පියවර මාරු කරල තියෙන්නෙ..පුතාල එහෙමනම් පිළිවෙලකට ලියන්න.

  1.මල් එකතු කර ගැනීම

  2.දන්සල පවත්වන තැනක් තෝරා ගැනීම.

  3.මල් දෝවනය කිරීම.

  4.පවත්වන තැන පිරිසිදු කිරීම.

  5.මල් ගොටු සකස් කර මල් දැමීම.

ඔයාලා හරිම ආසයි නේද මල්වලට.එහෙමනම් දුවේ පුතේ අපිත් ඊළඟ අවුරුද්දෙදි මල් දන්සලක් දෙමු.දන්සලෙන් කරන්නෙත් දානයක්,ගොඩක් පින් ලැබෙනවා.

අපි එහෙනම් බුද්ධ වන්දනාවට නෙලා ගන්නත් එක්ක මල් පැළයක් සිටවමු.වතුර දාලා පොහොර දාලා රැක බලා ගනිමු.මල් පිපුණු දවසට බුදු සාදුට පූජා කරමු.

මල් දන්සල 1- බුද්ධ ධර්මය විෂය යටතේ මෙම පාඩමට අදාළ වීඩියෝ නැරඹීම සඳහා youtube එකට ගොස් Renuka kumari -මල් දන්සල 1 )ලෙස search කරන්න .